D 141

# ''භදන්ත බුද්ධඝෝස නවොත්පාදකයෙක්ද? අනුරූපීකාරකයෙක්ද? ක්‍රමවේද කාරකයෙක්ද? විසුද්ධිමග්ගය ආශ්‍රයෙන් කෙරෙන අධ්‍යයනයක්.''

26 JAN 2017
Examination Branch
Colombo - 03

උඩුහාවර ආනන්ද හිමි

(BA, MA, Mphil)

2011/PhD/081

මෙම පර්යේෂණ නිබන්ධය කොළඹ විශ්වවිද්‍යාලයේ දර්ශන විශාරද උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

2016 ජූලි

බෞද්ධ අධ්‍යයන අංශය

ශාස්ත්‍ර පීඨය

කොළඹ විශ්වවිද්‍යාලය

University of Colombo Library Sri Lanka

UCLIB
583472

# හැඳින්වීම

භදන්ත බුද්ධඝෝෂ හිමියෝ ථෙරවාද අර්ථකථන සම්ප්‍රදායෙහි විශිෂ්ටතම ආචාර්යවරයාණෝ වෙති. මූලික බුද්ධ වචනය නිර්වචනය කිරීම සම්බන්ධයෙන් උන්වහන්සේගේ පාණ්ඩිත්‍යයෙහි ආධිපත්‍ය සමස්ත ථෙරවාදී පාලි අට්ඨකථා සාහිත්‍යය පුරා පැතිරී පවතී. ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායෙහිදී 'භදන්ත බුද්ධඝෝෂ හිමියන්ගේ නිර්වචනය' අවසන් නිර්වචනය ලෙස පිළිගෙන තිබේ. ථෙරවාද සම්ප්‍රදායට අයත් මහාවිහාර අර්ථකථන සම්ප්‍රදායේද ප්‍රධාන ප්‍රකාශකයා වශයෙන් පිළිගැනෙන භදන්ත බුද්ධඝෝෂ හිමියන්ගේ අපදානය හා කාර්යභාරය පිළිබඳ විවිධ අධ්‍යයනයන් සිදුකර ඇත. උන්වහන්සේගේ අර්ථකථන ක්‍රමවේදය හා කාර්ය පිළිබඳ විචාරාත්මක අධ්‍යයන ආරම්භ වූයේ මෑත අවදියේය. ඒ අතුරින් ඊ. ඩබ්ලිව්. අදිකාරම් විසින් ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යනය කරමින්, පාලි අට්ඨකථා ආශ්‍රයෙන් සම්පාදිත **'ලක්දිව ආදි බෞද්ධ ඉතිහාසය'** නැමති කෘතිය වැදගත් වේ. මෙම අධ්‍යනයේදී අදිකාරම් විසින් භදන්ත බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨකථා ඇතුළත්ව, අට්ඨකථා සාහිත්‍යය පිළිබඳ ඉතා අගනා හැඳින්වීමක් ඉදිරිපත් කරන අතර, ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමෙහිලා පාලි අට්ඨකථා සාහිත්‍ය මූලාශ්‍රයක් ලෙස කොතෙක්දුරට වැදගත් වන්නේද යන්නද පෙන්වාදෙයි. අට්ඨකථා සාහිත්‍යය පදනම්කරගත් අදිකාරම්ගේ අධ්‍යනය ප්‍රධාන වශයෙන් ලංකා ඉතිහාස විෂය කෙරෙහි අවධානය යොමුකර තිබෙන අතර, භදන්ත බුද්ධඝෝෂ හිමියන් විසින් පර්යේෂණයට ලක්කරනු ලබන ධර්ම සංකල්ප පිළිබඳ නිර්වචන හා විවරණ කෙරෙහි අවධනය යොමුකර නොමැත. මෙයට සමගාමීව අග්ගමහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත මාහිමියන්ගේ **'අටුවාපරීක්ෂණය හා අටුවාකථාවස්තු'** , **'ථෙරවාද බෞද්ධාචාර්යයෝ** ', **'පාලි සාහිත්‍යය'** යන කෘතිවල මෙන්ම,මාවුස්සාගොල්ලේ සිරිසුමන හිමියන්ගේ **'බුද්ධඝෝෂ සහ බෞද්ධ සංස්කෘතිය'**, මහාචාර්ය ජී. පී. මලලසේකරගේ **Pali Literature of Ceylon**, මහාචාර්ය තොසිචි එන්දොගේ **Studies in Pali Commentarial Literature**, ලබුහේන්ගොඩ චන්දරතන හිමියන්ගේ **'පාලි අට්ඨකථා සාහිත්‍යය'** , ඩී. ජේ. කළුපහනගේ ***A Source Book on Later Buddhist Philosophy***, **"Buddhaghosa and Path of Purity (Visuddhimagga)**, එල්. එස්. කසීන්ගේ (L.S. Cousins) **The Origin of Insight Meditation,** The Buddhist Forum, Vol. IV, 1994-96 (Tadeusz Skorupski - Editor), **Samatha-yāna and Vipassanā-yāna,** Buddhist Studies in Honour of

Hammalava Saddhātissa – 1984 (Dhammapala, Gombrich, Norman - Editors), රූපත් ගෙතින්ගේ (Rupert Gethin), **On the practice of Buddhist Meditation According to the Pali Nikayas and Exegetical Sources,** Tzungkuen Wen, **A Study of Sukkhavipassaka in Pali Buddhism,** ආදී නිබන්ධයන්හිදී භදන්ත බුද්ධඝෝෂ හිමියන්ගේ චරිතය, අර්ථවිවරණ ක්‍රමවේදය හා උන්වහන්සේ විසින් හඳුන්වාදෙන ලදැ'යි සැලකෙන නව සංකල්ප පිළිබඳ කේවල වශයෙන් අධ්‍යනයන් සිදුකොට ඇති අතර, මහාචාර්ය කළුපහන හා මහාචාර්ය තොසිචි එන්දො යන අයගේ අධ්‍යයනයන් එයින් විශේෂ වන්නේ භදන්ත බුද්ධඝෝෂ හිමියන්ගේ අර්ථවිවරණ ක්‍රමවේදය පිළිබඳ විචාරාත්මකව කරුණු විමර්ශනය කරන හෙයින්ය. මෙම නිබන්ධ සියල්ල අප පර්යේෂණය සඳහා අවශ්‍යය පූර්ව අධ්‍යයන සඳහා හේතු වන ඉතාම වැදගත් මූලාශ්‍රය වේ.

භදන්ත බුද්ධඝෝෂ හිමියන් හා උන්වහන්සේගේ කාර්යභාරය පිළිබඳ කෙරෙන විචාරාත්මක අධ්‍යයන බෞද්ධ උගතුන් විසින් මෑත කාලයේ ආරම්භ කරන ලද්දකි. එහිදී භදන්ත බුද්ධඝෝෂ හා අනෙකුත් අට්ඨකථාචාර්යවරුන් විසින් මූලික බුද්ධවචනය නිර්වචනය කිරීමේදී කරන ලද වෙනස්කම් කෙරෙහි ඔවුන් අවධානය යොමුකර තිබේ. භදන්ත බුද්ධඝෝෂ හිමියන් මහාවිහාර සම්ප්‍රදායට අනුගත වෙමින් ස්වකීය අර්ථ විවරණ ක්‍රමවේදය ඉදිරිපත් කරන බව උන්වහන්සේගේ අට්ඨකථාවන්හි අවධාරණය වන කාරණයකි. එසේ ප්‍රකාශ කළද, අර්ථ විවරණ කාර්යයේදී කොතෙක් දුරට එම ස්ථාවරයේ පිහිටා කටයුතු කර ඇත්තේද යන්න විමසා බැලිය යුතු වේ. මේ පිළිබඳව විමර්ශන සිදු කළ ඇතැම් නූතන උගතුන්ගේ පිළිගැනීම වන්නේ උන්වහන්සේ මහාවිහාර මතයට අනුගත වෙමින් අර්ථ විවරණ කාර්යයෙහි නියුක්ත වුවත්, සැම විටම එම ස්ථාවරයේ පිහිටා කටයුතු නොකළ බවයි. උන්වහන්සේ විසින් නව අදහස් හා සංකල්ප රැසක් හඳුන්වාදෙමින් ථෙරවාද බෞද්ධ චින්තනය පෝෂණය කර ඇති බව එම විද්වතුන්ගේ මතයයි. මෙම උගතුන් අතරින් මහාචාර්ය ඩී.ජේ. කළුපහණ ඉදිරිපත් කරන අදහස් බෙහෙවින් වැදගත් වන්නකි. ඔහුගේ අදහසට අනුව භදන්ත බුද්ධඝෝෂ සාර්ථක අනුරූපී කාරකයෙකි. එසේම ඉතා සියුම් ලෙස නව්‍ය අදහස් එක්කර තිබෙන බවද ඔහු සඳහන් කරයි. මෙම පසුබිම යටතේ භදන්ත බුද්ධඝෝෂ හිමියන්ගේ අර්ථ විවරණ ක්‍රමවේදයෙහිදී, උන්වහන්සේ මහාවිහාර සම්ප්‍රදායට අනුගත වී තිබේද? නවෝත්පාදක සංකල්ප එක්කොට තිබේද? උන්වහන්සේගේ

අර්ථවිවරණයන්හි අනුරූපීකාරකයෙකුගේ ලක්‍ෂණ පෙන්නුම් කරන්නේද? එසේ නැතහොත් ථෙරවාද සම්ප්‍රදායට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී තිබෙන්නේද? යන ප්‍රශ්න ගොඩනැගිය හැකි වේ.

හදන්ත බුද්ධඝෝස හිමියන් විසින් මහාවිහාර සම්ප්‍රදායට අනුකූලව ඉදිරිපත්කරන ලද සංකල්ප හා උන්වහන්සේ විසින් අභිනවයෙන් හඳුන්වාදෙන සංකල්ප කවරේද යන්න ඓතිහාසික වශයෙන් පැහැදිලිව වෙන්කොට දැක්වීම අතිශය දුෂ්කර කාර්යක් වෙයි. විශේෂයෙන්ම අට්ඨකථා පරිවර්තනයේදී භාවිත කළ ප්‍රධාන මූලාශ්‍රය වන සීහලට්ඨකථා හා අනෙකුත් මූලාශ්‍රය නෂ්ටප්‍රායව තිබීම මෙයට ප්‍රධාන හේතුවයි. එසේ වුවද උන්වහන්සේ හා අනෙකුත් අට්ඨකථාචාර්යවරුන් විසින් සම්පාදිත අට්ඨකථාවන්හී අන්තර්ගත බුද්ධවචනය නිර්වචනය කිරීමේ ක්‍රමවේදය මූලික පිටක ග්‍රන්ථ හා තුලනාත්මකව අධ්‍යනය කිරීමෙන් යම් පමණකට හෝ එම ගැටලුව විසඳීමට අවශ්‍ය පදනම සකස්කරගත හැකියැ'යි විශ්වාස කළ හැකිය. එසේම හදන්ත බුද්ධඝෝස හිමියන්ගේ අර්ථකථන ක්‍රමවේදය හා අට්ඨකථා සාහිත්‍යය පිළිබඳ කේවල වශයෙන් අධ්‍යනයන් කළ විද්වතුන්ගේ අදහස්ද මෙම පර්යේෂණය සඳහා උපයුක්ත කරගැනේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනයේදී ප්‍රධාන වශයෙන් **හදන්ත බුද්ධඝෝස නවොත්පාදකයේක්ද? අනුරූපීකාරකයෙක්ද? ක්‍රමවේද කාරකයෙක්ද?** යන මූලික ප්‍රශ්න පර්යේෂණාත්මකව සාකච්ඡා කරනු සඳහා උන්වහන්සේ විසින් සම්පාදිත විසුද්ධිමග්ග හා පාලි අට්ඨකථා ආශ්‍රය කරගෙන තිබේ. එහිලා උපයෝගී වන ප්‍රධානම මූලාශ්‍රය වන්නේ විසුද්ධිමග්ගයයි. එය සමස්ත ත්‍රිපිටකයම අළලා කළ අට්ඨකථාවක් ලෙස පිළිගැනෙන අතර, උන්වහන්සේගේම ස්වාධීන රචනයක් වශයෙන්ද සැලකේ. විසුද්ධිමග්ගයේ අන්තර්ගතය පරීක්‍ෂාකිරීමෙන් හා ඒ පිළිබඳ විචාරාත්මක ලෙස කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව උක්ත ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සැපයීමට අපේක්‍ෂා කරන හෙයින් මෙම නිබන්ධය සම්පූර්ණයෙන් අදාළ මූලික බෞද්ධ ග්‍රන්ථ පදනම්කර කරගනිමින් පර්යේෂණයට ලක්වන්නකි.

## මූලාශ්‍රය

හදන්ත බුද්ධඝෝෂ හිමියන්ගේ චරිතය පිළිබඳ මූලික තොරතුරු අතිශයෝක්ති වර්ණනාවලින් යුක්තව ප්‍රබන්ධගත කරන ලද ඒවා වේ. බුරුම සම්ප්‍රදායට අයත් **බුද්ධඝොසුප්පත්තිය** එවැනි අතිශයෝක්ති රචනා පදනම් කරගෙන ගොඩනැගුණු තොරතුරු රැසකින් යුක්ත ග්‍රන්ථයක් වේ. මෙයට අමතරව උන්වහන්සේ විසින් සම්පාදිත විසුද්ධිමග්ග හා සෙසු බුද්ධඝෝස අට්ඨකථා ආශ්‍රයෙන්ද මෙම පර්යේෂණයට අවශ්‍යය මූලික තොරතුරු සපයාගත හැකි වේ. **විසුද්ධිමග්ග** හා පාලි අට්ඨකථා සඳහා සම්පාදිත ටීකා ග්‍රන්ථද මේ සම්බන්ධයෙන් වැදගත් වන අන් මූලාශ්‍රය වේ. ඒ අතුරින් ආචාර්ය ධම්මපාල හිමියන්ගේ පරමත්ථමංජුසා නම් විසුද්ධිමග්ග ටීකාව බෙහෙවින් උපයෝගී වන්නකි. විසුද්ධිමග්ග සම්පාදනයේදී හදන්ත බුද්ධඝෝස හිමියන් මූලික පෙළ ග්‍රන්ථ රැසක් මූලාශ්‍රය ලෙස භාවිතකොට තිබේ. එසේ ආශ්‍රිත මූලික පෙළ ග්‍රන්ථ හා සම්බන්ධ අදාළ කොටස් පරීක්ෂා කිරීම අවශ්‍ය වන හෙයින්, එම කොටස් අන්තර්ගත පිටක ග්‍රන්ථ හා අට්ඨකථාද මූලාශ්‍රය ලෙස යොදාගැනේ. ඉහතින් දැක් වූ මූලික පෙළ හා අටුවා ග්‍රන්ථවලට අමතරව හදන්ත බුද්ධඝෝස හිමියන්ගේ ජීවන තොරතුරු හා කාර්යභාරය පිළිබඳ විවරණය කරමින් සම්පාදිත ශාස්ත්‍රීය හා සාමාන්‍ය ගණයේ ප්‍රමාණික ද්විතීයක මූලාශ්‍රය රැසක්ද දක්නට ලැබේ. අධ්‍යයන පසුබිම හා සංකල්ප අධ්‍යනයෙහිලා අවශ්‍ය මූලික තොරතුරු සපයා ගැනීමේදී මෙන්ම, විචාරාත්මක කරුණු විශ්ලේෂණය කිරීමේදී මෙම ද්විතීයක මූලාශ්‍රය බෙහෙවින් වැදගත් වේ. විසුද්ධිමග්ග හා පාලි අට්ඨකථා ආදී ප්‍රාථමික මූලාශ්‍රය ආශ්‍රයෙන් හදන්ත බුද්ධඝෝස හිමියන් **නවොත්පාදකයේක්ද? අනුරූපීකාරකයෙක්ද? ක්‍රමවේද කාරකයෙක්ද?** යන්න විමසා බැලෙන අතර එමගින් එළඹෙන නිගමන සම්බන්ධයෙන් තවදුරටත් කරුණු සනාථ කිරීමෙහිලා ද්විතීයක මූලාශ්‍රයන්ගේ සහාය ලබා ගෙන තිබේ. නිබන්ධය අවසානයේ මෙම අධ්‍යනය සඳහා පාදක කරගත් ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය පිළිබඳ නාමාවලියක් ඇතුළත් කෙරේ.

## අධ්‍යයන ආකෘතිය

මෙම අධ්‍යනය පරිච්ඡේද හයකින් සමන්විත වේ. **හදන්ත බුද්ධඝෝස හා විසුද්ධිමග්ග** යනුවෙන් හැඳින්වෙන පළමු පරිච්ඡේදය මගින් හදන්ත බුද්ධඝෝස හිමියන්ගේ ජීවන චරිතය, උන්වහන්සේගේ කාර්ය භාරය හා විසුද්ධිමග්ග පිළිබඳ විචාරාත්මකව අධ්‍යයනය කෙරේ.

අර්ථකථාචාර්යයකු වශයෙන් උන්වහන්සේගේ භූමිකාව, දකුණු ඉන්දීය බෞද්ධ තත්ත්වය, විසුද්ධිමග්ග හා විමුත්තිමග්ග අතර පවතින සම්බන්ධය, විසුද්ධිමග්ග හා ථෙරවාද සම්ප්‍රදාය, විසුද්ධිමග්ග විවරණ ක්‍රමවේදය, සප්ත විසුද්ධිය හා දසකථා අතර සම්බන්ධය ආදී අංශ කෙරෙහි එහිදී මූලික අවධානය යොමුකෙරේ.

දෙවන, තෙවන, සිව්වන හා පස්වන පරිච්ඡේද මගින් සිදු කරනු ලබන්නේ ප්‍රධාන අධ්‍යයන ගැටලුව විමර්ශනය කිරීමය. ඒ අනුව **විසුද්ධිමග්ග හා ආරාමික ශීලය** යන දෙවන පරිච්ඡේදය මගින් ශීලය පිළිබඳ භදන්ත බුද්ධඝෝස හිමියන්ගේ විවරණය, විසුද්ධිමග්ග ආශ්‍රයෙන් විමර්ශනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී මූලික බුදුසමයේ එන ශීලය පිළිබඳ විග්‍රහය හා විසුද්ධිමග්ග ශීලය පිළිබඳ විවරණය අතර පවතින සමවිසමතා හා භදන්ත බුද්ධඝෝස හිමියන් විසින් එයට එක්කරන ලද නව සංකල්ප මෙන්ම විසුද්ධිමග්ගයෙන් අවධාරිත ආරාමික ශීලය පිළිබඳ කරුණු සාකච්ඡා කෙරේ. **විමුක්ති මාර්ගයට ධූතාංග අනුයුක්ත කිරීම** යනුවෙන් දැක්වෙන තෙවන පරිච්ඡේදය යටතේ විමුක්තිමාර්ගය හා ධූතාංග අතර ඇති අදාළත්වය විමසා බැලෙන අතර විසුද්ධිමග්ග මගින් තෙළෙස් ධූතාංග විමුක්තිමාර්ගයට අන්තර්ග්‍රහණය කිරීමෙහිලා දරන ලද ප්‍රයත්නය පරීක්ෂා කෙරේ. ඒ යටතේ ධූතාංග පිළිබඳ මුල් බුදුසමයේ ආකල්පය, ධූතාංග සමාදානය හා ලාංකේය භික්ෂු සමාජය, මිලින්දපඤ්හය (මිලින්ද ප්‍රශ්නය) හා ධූතාංග සමාදානය, විසුද්ධිමග්ග හා ධූතාංග සමාදානය යන උපමාතෘකා යටතේ කරුණු සාකච්ඡා කෙරේ. **විසුද්ධිමග්ග හා ථෙරවාද සමථ භාවනා ක්‍රමවේදය** යනුවෙන් නම් කෙරෙන සිව්වන පරිච්ඡේදය විසුද්ධිමග්ගය මගින් හඳුන්වාදෙන ලද ථෙරවාද සමථ භාවනා ක්‍රමවේදය මුල්බුදුසමය හා තුලනය කරමින් පරීක්ෂා කරනු ලැබේ. මෙහිදී විසුද්ධිමග්ග විසින් එක්කරන ලද නව සංකල්ප හා එහි විවරණ මෙන්ම, ඉදිරිපත් කෙරෙන සමථ භාවනා ක්‍රමවේදය, සමාධි භාවනාවේ පූර්ව කෘත්‍ය, සමසතළිස් කර්මස්ථාන භාවනා විධි, ත්‍රිවිධ නිමිත්ත, උපචාර හා අර්පණා සමාධි, ධ්‍යාන ප්‍රතිලාභය හා මුල් බුදුසමය, ධ්‍යාන පිළිබඳ ආභිධාර්මික විග්‍රහය, ධ්‍යාන හා විසුද්ධිමග්ග, සමසතලිස් කර්මස්ථාන හා සම්බන්ධ භාවනා ක්‍රමවේදය යනාදී උපමාතෘකා යටතේ සමථ භාවනා ක්‍රමවේදය පිළිබඳ කරුණු විමර්ශනය කෙරේ. පස්වන පරිච්ඡේදය නම් කෙරෙන්නේ **විසුද්ධිමග්ග හා ථෙරවාද විපස්සනා භාවනා ක්‍රමවේදය** යනුවෙනි. එහි අන්තර්ගත කරුණු යටතේ ථෙරවාද විපස්සනා භාවනා ක්‍රමවේදයක් ගොඩනැංවීමෙහිලා භදන්ත බුද්ධඝෝස හිමියන් විසින් දරන ලද උත්සාහය විසුද්ධිමග්ග අවසන් පරිච්ඡේද දහය ආශ්‍රයෙන් විමසා බැලේ. කොටස් දෙකකින්

සමන්විත මෙම පරිච්ඡේදයේ පළමු කොටස යටතේ විසුද්මග්ගයේ එන ඛන්ධ, ධාතු, ආයතන විග්‍රහය, හදයවත්ථුරූප හා මිද්ධරූපය, චතුරාර්යසත්‍ය හා ප්‍රතීත්‍ය සමුත්පාදය, සූවිසි ප්‍රත්‍ය, චුති සහ පටිසන්ධි, භවචක්‍රය, ආදිය පිළිබඳ භදන්ත බුද්ධඝෝස හිමියන්ගේ විවරණය සාකච්ඡාවට භාජනය කරනු ලැබේ. දෙවන කොටසින් විසුද්ධිමග්ගයෙන් ඉදිරිපත් කෙරෙන විපස්සනා භාවනා ක්‍රමවේදය පංච විසුද්ධි පිළිබඳ විග්‍රහයෙන් අනාවරණය වන ආකාරය පැහැදිලි කෙරේ. මුල් පරිච්ඡේද පහ යටතේ සාකච්ඡා කරන ලද කරුණු ආශ්‍රයෙන් එළඹෙන ලද නිගමනවලින් සමන්විත හයවන පරිච්ඡේදය **සමාලෝචනය** යනුවෙන් නම්කර ඇති අතර එහි **භදන්ත බුද්ධඝෝස නවෝත්පාදකයේක්ද? අනුරූපීකාරකයෙක්ද? ක්‍රමවේද කාරකයෙක්ද?** යන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු ඉදිරිපත් කිරීමෙන් අධ්‍යනය පිළිබඳ සාකච්ඡාව අවසන් කෙරේ.